# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/20 - 2020 ජනවාරි මස 07 වැනි අඟහරුවාදා - 2020.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DS/GFG/L&L/5/99.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ අංකය*: 4-3/11/2017/UD/171.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර-*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සභා සීමාව තුළ 101E, මලිගස්පේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය මලිගස්පේ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810019 දරන කැඩැස්තර පිඹුරේ, කලාප අංක 01හි පත්‍ර අංක 11හි කැබලි අංක 245 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0057 ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම් :

**කැබලි අංක 245**

ඉඩමේ නම: ප්‍රවේනි වෙදගේ කුඹුර ඕවිට;හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; මුල් හිමිකම් පාන්නා: ප්‍රිඩා වීරවික්‍රම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0057 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන්හෝ 2020.01.29 වැනි දින පෙ.ව. 9.00 ට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020.01.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. හිමාලි රත්නවීර,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත්සතර- ගාල්ල.

2020 ජනවාරි මස 03 වන දින,
ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-566